24

# ඉපයීම 2

## වෙළෙඳම

එක්තරා භාණ්ඩයක හෝ දේපලක අයිතිය ලබා ගෙන තවත් කෙනකුට එහි අයිතිය ලබා දීම වෙළෙඳම වෙයි. කෘෂි කාර්මික නිෂ්පාදන හෝ වෙනත් යම් කර්මාන්තයක නිෂ්පාදන ජනතාව අතට පත් වන්නේ වෙළෙඳාම මගිනි. ඒ අනුව වෙළෙන්දා, නිෂ්පාදකයා සහ පාරිභෝගිකයා අතර සිටින අතරමැදියෙකි. එම නිසා වෙළෙඳම ඉස්ලාම් අනුමත කළ අතර එම සේවාව අගය කර ඇත.

'විශ්වසනීය වෙළෙන්දෝ (පරලොව දී) නබිවරුන් සමග සිටිති.'(තිර්මිදි)



වෙළෙඳාම යනු සංකීර්ණ ඉපැයීම් ක්‍රමයකි. සමහරු වෙළෙඳම හා පොළිය වෙන් කර හඳුනා ගැනීමට නොහැකි ව පසුතැවිලි වෙති. තවත් සමහරු වෙළෙඳාම, හලාල් වීම සඳහා අනුගමනය කළ යුතු කොන්දේසි ගැන නොතකා ලාභ ලැබීමේ චේතනාවෙන් ම පමණක් නිදහසේ වෙළෙඳාමෙහි යෙදී සිටිති. එම නිසා සංකීර්ණ ආර්ථික ක්‍රමය තුළ උපදින ගැටළු අල් කුර්ආනය සහ සුන්නාව උපයෝගී කරගෙන නිරාකරණය කරමින් ඒ සඳහා අනුගමනය කළ හැකි හලාල් වූ ක්‍රියා පිළිවෙත් හා ඉස්ලාමීය නීති රීති පිළිබඳ ව විද්වත්හු පැහැදිලි කර ඇත. මුස්ලිම් ව්‍යාපාරිකයකු මේවා සියල්ල දැන වෙළෙඳාම් කිරීම අනිවාර්ය (ෆර්ලු) වෙයි.

උමර් (රළි) තුමා වෙළෙඳපොළට ගොස් වෙළෙඳාම සම්බන්ධ වූ නීති රීති පිළිබඳ ව නිසි අවබෝධයක් නොමැති අය වෙළෙඳාම් කිරීම තහනම් යැයි කීවේ ය. මක් නිසා ද යත් එවැන්නන් ගේ වෙළෙඳාම තුළ දැනුවත් ව හෝ නොදැනුවත් ව පොළිය අන්තර්ගත විය හැකි යැයි එතුමන් අවවාද කළේ ය.

ඉස්ලාමීය දැක්මට අනුව, වෙළෙඳාමක් අනුමත වීමට මූලික කරුණු කිහිපයක් හා කොන්දේසි කිහිපයක් සම්පූර්ණ විය යුතු ය.

**වෙළෙඳාමෙහි මූලික කරුණුඃ-**

1. ගැනුම්කරු - විකුණුම්කරු
2. වෙළෙඳ භාණ්ඩ
3. ඊජාබ් - කබූල්

**ගැනුම්කරු- විකුණුම්කරු**

1. නිසි වයසට පැමිණි අයෙකු විය යුතු ය.
2. සිහි බුද්ධියක් ඇති කෙනෙකු විය යුතු ය.
3. වෙළෙඳාම පිළිබඳ මනා දැනුමක් ඇත්තෙකු විය යුතු ය.

**වෙළෙඳ භාණ්ඩ**

1. විකුණුම්කරුට අයිති විය යුතු ය.
2. ගැනුම්කරුට භාරදිය හැකි තත්ත්වයක තිබිය යුතු ය.
3. අත්පිට තිබිය යුතු ය.
4. ඉස්ලාමීය ෂරීආවට අනුව පිරිසිදු හා ප්‍රයෝජනවත් භාණ්ඩයක් විය යුතු ය.

**ඊජාබ් - කබූල්**

ඊජාබ් යනු විකුණන්නා තමා විකුණූ භාණ්ඩය විකුණූ බවටත් කබූල් යනු මිල දී ගන්නා තමා එය තෘප්තිමත් ව පිළිගන්නා බවත් ප්‍රකාශ වීම ය. මෙය වාචික ව හෝ ලිඛිත ව හෝ දැනට ක්‍රියාත්මක වන වෙනත් ක්‍රමයකට හෝ සිදු විය හැක.

**වෙළෙඳ ගනු දෙනුවේ දී තහනම් කළ දේ**

1. අනවශ්‍ය දිවුරීම
2. කිරුම් මිණුම් වංචා
3. සැඟවීම
4. අධික මිළ තැබීම
5. මිශ්‍ර කිරීම
6. බොරු කීම
7. රැවටීම
8. පොදු නීතිරීති උල්ලංඝනය කිරීම

වෙළෙඳාමේ දී විකුණන්නා සහ මිළ දී ගන්නා ඉහත දැක්වෙන ඉස්ලාමීය සිද්ධාන්ත අනුගමනය කර වෙළෙඳාමේ යෙදීමෙන් විවිධ ප්‍රයෝජන ලබා ගත හැකි ය.

1. ඔවුන්ගේ ගනුදෙනු ක්‍රියාවලිය නැමදුමක් බවට පත් වේ.
2. මිළ දී ගන්නා සහ විකුණන්නා අතර සුහදතාවයක් ඇති වෙයි.
3. වෙළෙඳමේ ස්ථාවරත්වයක් ඇති වෙයි.
4. අනවශ්‍ය දෝෂාරෝපන වලින් ආරක්ෂාව ලැබේ.
5. හරාම් වන ගනු දෙනු වලින් මිදිය හැකි ය.

එම නිසා වෙළෙඳාම් කටයුතු වල දී ඉස්ලාමීය සීමාවන් තුළ එම කටයුතු කිරීමෙන් දෙලොවට ම ප්‍රයෝජන වත් අන්දමට ක්‍රියා කරමු.

## සේවාවන්

ඉපැයීමට දරන උත්සහයන් අතර සේවා සැපයීම ද එකකි. කෙනකු තවත් කෙනකුට සේවාවක් ලබා දී ඒ සඳහා වැටුපක් ලබා ගැනීම සේවා තත්ත්වයේ රැකියාවක් යැයි කියනු ලැබේ. සේවකයාගේ දැනුම, හැකියාව, කාලය, ශ්‍රමය, ආදිය ඔහුගේ ධනය වේ. එක් සේවා වෘත්තිකයකු තමාගේ දැනුම හැකියාවට අදළ විවිධ සේවාවන් ලබා දී එයට උචිත වේතනයක් ලබා ගැනීම ඉස්ලාමය පිළිගත් සිද්ධාන්තයකි.
සේවා සපයන රැකියා කොටස් දෙකකට වර්ග කළ හැක.

(අ) බුද්ධිය සම්බන්ධ (ගුරු වෘත්තිය, ලිපිකාර වෘත්තිය)
(ආ) කායික ශ්‍රමය (සුළු සේවකයන්, කම්කරුවන්, ආරක්ෂක සේවා)

මේවායින් අධික පිළිගැනීමක් හා වැටුපක් ලබා දෙන සේවාවන් හා එසේ නොමැති සේවාවන් වශයෙන් සමාජීය බෙදීමක් පවතින නමුත් ඉස්ලාම් මගින් කෙනකු කරන රැකියාව අනුව ඔහුගේ තත්ත්වය මැන බලන්නේ නැත. කරන රැකියාව කුමක් වුවත් එම රැකියාවට සහ එහි නිරත වන පුද්ගලයාට ඉස්ලාම් හි පූර්ණ පිළිගැනීමක් ඇත. එම නිසා නබි (සල්) තුමා "ඔබලාගෙන් කෙනකු තමා සතුව ඇති ලණුවක් රැගෙන ගොස් දර රැස් කර එකට

බැඳ එම දරමිටි තම කර මත තබා රැගෙන විත් විකිණීම ජනතාවගෙන් සිඟා කෑමට වඩා ශ්‍රේෂ්ඨ වේ" යැයි පැවසී ය.

ඉස්ලාමීය දැක්මට අනුව එක් එක් පුද්ගලයා අල්ලාහ් තආලාගෙන් විශේෂ හැකියාවන් ලබා ඇති කෙනකු වේ. ඔහු තම හැකියාව හඳුනාගෙන එයට අදාළ රැකියාව කිරීම වැදගත් ය. කීර්තිය, වැටුප යන දේ සඳහා තමාට නොහැකි නුසුදුසු රැකියාවක් කිරීම ඉස්ලාමය කිසිවිටක පිළිගන්නේ නැත. අබූදර් අල් කිෆාරි (රළි) තුමා නබි (සල්) තුමා වෙත පැමිණ "අල්ලාහ්ගේ දූතයාණනි ! මා යම් තනතුරකට පත් කරන්නේ නොමැති ද?"යනුවෙන් විමසුවේ ය. එයට නබි (සල්) තුමා තම හස්තයෙන් ඔහුගේ උරහිසට තට්ටු කර අබූදර් ඔබ දුබල පුද්ගලයෙකි තනතුරක් යනු අති විශාල වගකීමකි. තනතුරට සුදුසු පුද්ගලයා එය ලබාගෙන එහි රාජකාරි ඉටු නොකළොත් එලොවේ දී දුක සහ පසුතැවිල්ලට එය හේතුවක් (මුස්ලිම්) වේ.

තවදුරටත් නබි (සල්) තුමා "විනිශ්චය කරුවන් වර්ග තුනක් ඇත. ඔවුන්ගෙන් එක් පිරිසක් ස්වර්ගයේ ද තවත් පිරිසක් නිරයේ ද සිටිති. ස්වර්ගයේ සිටිනා අය කවරකු ද යත් සත්‍යය යථාර්ථය අවබෝධ කරගෙන ඒ අනුව තීන්දු ලබා දුන්නවුන් වේ. සත්‍ය වටහාගෙන එයට පටහැනි ව විරුද්ධ තීන්දු ලබාදුන් අය හා අවබෝධයකින් තොරව තීන්දු ලබාදුන් අය නිරයේ සිටිති" යැයි කීවේ ය. (තිර්මිදි)

අල්ලාහ් තම ගැත්තන්ගෙන් බොහෝ දෙනකුට එකිනෙකට වෙනස් වූ දක්ෂතා හා කුසලතා ලබා දී ඇත. ඔවුන් තමන්ට ගැළපෙන ඉපයීම් ක්‍රමය සොයා ඒවා ළඟා කර ගැනීම ප්‍රශංසනීය කරුණක් වේ. එසේ නොමැතිනම් ඔවුන් අල්ලාහ් විසින් ලබා දුන් ආනිශංස (දයාද) අපයෝජනයට ලක් කළ අය ලෙස සැලකේ.

වෙනත් රැකියා මෙන් නොව සේවාවන් වැටුප අභිබවා යයි. එම නිසා වැටුපට සරිලන සේවයක් හෝ කිරීම සේවා සපයන අයගේ යුතුකම වෙයි.

සේවා වෘත්තිය නවීන ලෝකයේ ව්‍යාප්ත වී ඇත. රටක ආර්ථික සංවර්ධනයට මෙම අයගේ දයකත්වය ඉතා වැදගත් වෙයි. සේවා වෘත්තින් හි සිටින සෑම කෙනකුම කවදත් ගෞරවයට ලක් විය යුතු ය. ඔවුන්ගේ සේවාව අවතක්සේරු නොකර නියමිත සේවාවට නියමිත වැටුප උචිත වෙලාවේ ම පිරිනැමිය යුතු ය. සේවකයාගේ ඩහදිය වියළීමට පෙර ඔහුගේ වැටුප ගෙවීම අනිවාර්ය බව නබි (සල්) තුමා අවවාද කළේ ය.

සේවක අයිතිවාසිකම් වලට ඉස්ලාම් මුල්තැන දෙනවා සේම ඔහුගේ සේවාව පිළිබඳව ද අවධාරණය කරයි. තමා ලබාගන්නා වැටුපට සරිලන හා ඒ සඳහා වූ ගිවිසුමකට යටත් ව සේවය ලබා දීම ඔහු සතු වගකීමකි. පහත සඳහන් අල් කුර්ආන් වැකිය මෙය තහවුරු කරන්නේ ය. කිරුම් මිනුම් වල දී වංචා කරන අය විනාශ යි. ඔවුන් ජනතාවගෙන් ගන්නා විට වැඩියෙන් කිරන අතර දෙන විට අඩුවෙන් කිරා දෙයි. අන් අය පාඩුවට ලක් කරයි. (83:1.2.3)

ව්‍යාපාරයට සෘජු ව සම්බන්ධ වන අල් කුර්ආන් වැකි සේවා ක්ෂේත්‍රයට ද බලපානු ඇත. අධික වැටුපක් බලාපොරොත්තු වන සේවකයා තම සේවාවේ අඩුවක් කළහොත් ඔහු අල්ලාහ්ගේ සාපයට ලක්වෙයි. එම නිසා සියලු ම සේවා එම විශ්වාසයෙන් යුතු ව කළ යුතු යි. ඒ තුළින් තමාගේ සේවාව යහපත් පුණ්‍ය කටයුත්තක් බවට පත්කර ගැනීමේ අවකාශය ලැබෙනු ඇත.

**අභ්‍යාස**

01. වෙළෙඳාමේ මූලික කරුණු හා ඒවායේ කොන්දේසි සඳහන් කරන්න

02. වෙළෙඳ ගනුදෙනු වල දී තහනම් කරන ලද දේ කුමක් ද?

03. වෙළෙඳාමේ දී ඉස්ලාමීය මග පෙන්වීම අනුගමනය කිරීමෙන් ලැබෙන කුසල් ලැයිස්තු ගත කරන්න.